# කොළඹ දිසා අධිකරණයේදිය

1. ශම්මි සිල්වා,
සභාපති,
ශ්‍රී ලංකා ක්‍රිකට්,
අංක. 35, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 07.

2. මොහාන් ද සිල්වා,
ලේකම්,
ශ්‍රී ලංකා ක්‍රිකට්,
අංක. 35, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 07.

නඩු අංකය :DMR 1435/2023

ස්වභාවය : මුදල්

වටිනාකම : රු.1,500,000,000/-

පටිපාටිය : සාමාන්‍ය

පැමිණිලිකරුවෝ

\- එරෙහිව -

හේෂා විතානගේ
ඩී-12, පාර්ලිමේන්තු මන්ත්‍රී නිවාස සංකීර්ණය,
මාදිවැල,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

සහ

අංක 180, නව නගරය,
ඇඹිලිපිටිය

විත්තිකරු

වර්ෂ 2023 ක්වූ අගෝස්තු මස 02 දිනදිය.

ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් ස්වකිය ලේඛනගත නිතිඥ, සංජය ෆොන්සේකා මහතා මගින් පෙනි සිටිමින් සිය පැමිණිල්ලෙන් මෙසේ ප්‍රකාශ කර සිටී :

1. 1 වන පැමිණිලිකරු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි නිසි පරිදි පත්කර ගන්නා ලද සභාපතිවරයා සහ 2 පැමිණිලිකරු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි නිසි පරිදි පත්කර ගන්නා ලේකම්වරයා වන අතර, එය ඡන්දය හිමි සහ ඡන්දය භාවිතා නොකරන සාමාජික ක්‍රිඩා සමාජ සහ සංගම් 105 කින් සමන්විත සංස්ථාපනය නොකරන ලද සංවිධානයකි. ශ්‍රී ලංකා ක්‍රිකට් වනාහි ක්‍රිඩා නිතිය යටතේ ලියාපදිංචි ජාතික ක්‍රිඩා සංගමයක් සහ රටේ ක්‍රිකට් ක්‍රිඩාවේ පාලක කාය වශයෙන් කටයුතු කරය බවයි.

2. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, මෙහි මින්මතු විස්තර කෙරෙන නඩු නිමිත්ත උපවිය වුයේ මෙම ගරු අධිකරණයේ ප්‍රාදේශිය අධිකරණ බලසිමාව තුල වන බැවින්, මෙම නඩුව අසා තිරණය කිරීමට මෙම ගරු අධිකරණය අධිකරණ බලය ඇති බවයි. පැමිණිලිකරුවන් විශේෂිතව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, P13(a) සහ P13(b) ලෙස ලකුණු කර ඇති මාධ්‍ය සාකච්ඡාව සමග P15(a) සහ (b) ලෙස ලකුණු කර ඇති හඬපටය ලබා දුන්නේ ද සහ P14 ලෙස ලකුණු කර ඇති පුවත් පත් ලිපිය මුද්‍රණය සහ/හෝ ප්‍රචාරය කරන ලද්දේ මෙම ගරු අධිකරණයේ ප්‍රාදේශිය අධිකරණ බලසිමාව තුල වන බවයි.

3. පැමිණිලිකරුවන් අයැද සිටින්නේ, මෙහි මින්මතු දැක්වෙන කරුණු සහ නඩු නිමිති ශ්‍රී ලංකා ක්‍රිකට් සාමාජිකයන් සහ නිලධාරින් ගේ අයිතින් සම්බන්ධව බලපාන බැවින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් හි සෙසු සාමාජිකයන් වෙනුවෙන් පැමිණිලිකරුවන් විසින් මෙම නඩුව ගොනු කිරීමට පැමිණිලිකරුවෝ මෙම ගරු අධිකරණයේ අවසරය පතා සිටින බවයි.

4. පැමිණිලිකරුවන් ප්‍රකාශ සිටින්නේ, විත්තිකරු රත්නපුර දිස්ත්‍රික්කයයෙන් සමගි ජන බලවේගය පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු බවයි.

5. පැමිණිලිකරුවන් වැඩිදුරටත් මෙසේ ප්‍රකාශ කර සිටිති:

අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වනාහි එහි ව්‍යවස්ථාව මත පදනම්ව එහි පරිපාලනය ඇතුළු දේශිය සහ ජාත්‍යන්තර යන දෙකෙහිම ශ්‍රී ලංකා ක්‍රිකට්වලට අදාල සියලු කටයුතු කළමනාකරණය කරන ජාතික සංගමය බවයි.

ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය යනු දේශියව සහ අන්තර්ජාතිකව දිගු කාලින කිර්තියක් සහිත ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආයතනයකි.

ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම අග්‍රගන්‍ය කීර්තිය සහ විස්තීර්ණ ජාලය සඳහා සුප්‍රසිද්ධය.

ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය දැඩිව විධිමත් කාර්ය පටිපාටින්ට අනුකූලව ක්‍රියාත්මක වන අතර, නිසි සහ නීතිමය ක්‍රියාදාමයන් ඔස්සේ තම නාමය රඳවා ගන්නා අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් හි කටයුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ සංශෝධිත 1973 අංක 25 ක්‍රීඩා පනත ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට යටත් වේ.

*පැමිණිලිකරුවන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාවේ සත්‍ය පිටපතක් "P1" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

**ශ්‍රී ලංකා ක්‍රිකට් හි මෑත කාලීන ජයග්‍රහණයන්**

6. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ නුදුරු අතීතියේදී, ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම, අද්වතිය ලෙස ඉන්දියාව පරදා, 2014 ICC T20 ලෝක කුසලානය ශූරයන් වෙමින් ජයග්‍රහනය ලබාගත් බවත්, ඔවුන් 2007 සහ 2011 ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලියන් හි පිට පිටම අනු-ශූරයන්වූ බවත් සහ 2009 සහ 2012 ICC T20 ලෝක කුසලාන තරගාවලි වලදීද අනු-ශූරයන් බවට පත්වූහ.

7. ශ්‍රී ලංකා ක්‍රිකට් පිරිමි කණ්ඩායම විසින් හොඳම T20 කණ්ඩායම වශයෙන් ලෝකව්‍යප්ත ගෞරව නාමය හිමි කරගනිමින් මාස 32 ක් පුරා කාලයක් පලමු ස්ථානයේ රැඳී සිටිය බවයි. තවද, ඔවුන් වෙන වෙනම අවස්ථා තුනකදී T20 ලෝක ශූරතා තරගාවලියේ අවසන් මහා තරගයට ලගා වී ඇත.

8. තවදුරටත්, ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම 2022 වර්ෂය සඳහා ආසියානු ශූරයන්ගේ කිරුළ හිමි කරගත් බවයි. එමෙන්ම, මේ වන විට එම කණ්ඩායම චමත්කාරී ජය මාවතකට පිවිස අඛණ්ඩව ඔවුන්ගේ අවසන් ජාත්‍යන්තර එක් දින තරග 10 ම ජයගෙන ඇත.

9. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා කණ්ඩායම 2021-2022 වසර සඳහා වූ ටෙස්ට් ලෝක ශූරතාවලියේ ඉහළ පෙළේ ස්ථානයක් අත්කර ගත් බවයි.

*පැමිණිලිකරුවන් පුවත්පත් ලිපි වල සත්‍ය පිටපත් සම්පිණ්ඩනයක්ව "P2(a)(i)" සිට "P2(a)(xiii)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

10. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, සති කිහිපයකට පෙර, ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම ඉතිහාසයේ පළමු වතාවට ද්විපාර්ශවික තරගාවලියකදී නවසීලන්තයට එරෙහිව අමතක නොවන ජයක් අත්කර ගත් බවත්, තවද, කණ්ඩායම් නායිකාව ලොකයේ ජාත්‍යන්තර එක්දින ක්‍රීඩිකාවන් ශ්‍රේණිගත කිරීමේදී විශ්මිත ලෙස පළමු ස්ථානය අත්කර ගත් බවත්ය.

*පැමිණිලිකරුවන් පුවත්පත් ලිපි වල සත්‍ය පිටපත් සම්පිණ්ඩනයක්ව "P2(b)(i)" සිට "P2(b)(xiv)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

11. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ඉහතකී ජයග්‍රහණයන් එක් පසෙකින් පරිපාලකයන්ගේ, පුහුණුකරුවන්ගේ සහ තේරීම් කමිටු සාමාජිකයන්ගේ කණ්ඩායම් හැඟිම සහ සහයෝගිතාවය සහ අනෙක් පසින් ක්‍රීඩකයන්ගේ සුක්ෂම කැපවීමේ ප්‍රතිඵලයෙන් වන බවයි.

12. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නිසි ලෙස පත්කරන ලද නිලධාරි මණ්ඩලයක් යටතේ අඛණ්ඩව තම රාජකාරි කටයුතු ඉටු කරන බවත්, සහ නුදුරු අතීතයේදී, පිරිමි සහ කාන්තා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් තම කීර්තිය රැක ගැනිම සඳහා ඇපකැපවී සිටින අතර, එහි සම්මානිත ස්ථාවරය කෙලෙසෙන මොනයම් හෝ ක්‍රියාවකින් වැලකී සිටින ඇති බවත්ය.

__ඔස්ට්‍රේලියාවේ පැවති T20 ලෝක කුසලාන තරගාවලිය__

13. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටිනුයේ, 2022 ඔක්තෝබර්/නොවැම්බර් හිදී, ශ්‍රී ලංකා ජාතික පිරිමි ක්‍රිකට් කණ්ඩායම ඔස්ට්‍රේලියාවේ පැවති ICC T20 ලෝක කුසලාන තරගාවලියට සහභාගි වූ බවයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි විධායක කමිටුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි ප්‍රධාන විධායක නිළධාරී ඇශ්ලි ද සිල්වා මහතා සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ජෙරෝම් එල් ජයරත්න මහතා ද ඔස්ට්‍රේලියාවේ පැවති ICC T20 ලෝක කුසලාන තරගාවලියට සහභාගි විය.

14. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ක්‍රීඩා ඇමතිවරයා විසින් වර්ෂ 2022 ඔක්තෝම්බර් මස 7 වන දින එහි ලැයිස්තුගත කර තිබූ නිළධාරීන්ට 2022 ලෝක කුසලාන තරගාවලිය සදහා ශ්‍රී ලංකා ජාතික පිරිමි ක්‍රිකට් කණ්ඩායම සමග ඔස්ට්‍රේලියාවට යාමට අවසර ලබාදුන් බවයි.

*පැමිණිලිකරුවන්, 2022/10/07 දිනැති ලිපියේ සත්‍ය පිටපතක් "P3" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

<u>**T20 ලෝක කුසලාන තරගාවලිය අරබයා විගණන කෙටුම්පත් වාර්තාවක අවශ්‍යතාවයට හේතු වූ සිද්ධීන්**</u>

15. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අනුගමනය කරන ලද නොයෙකුත් විනය ක්‍රියාමාර්ගවලට ස්තූති වන්න වන්නට, ජාතික කණ්ඩායම් තුල විනය සහ පෙළඹවීම සම්බන්ධයෙන් සැලකිය යුතු වර්ධනයක් අත්කර ගැනීමට හැකිවූ බවයි. එසේ වුවත්, ඔස්ට්‍රේලියානු කාන්තාවක් සමග වූ උද්දේශිත සම්බන්ධයක් මත ඔස්ට්‍රේලියාවේදී එක් ක්‍රීඩකයකු අත්අඩංගුවට පත්වූ සිද්ධිය T20 ලෝක කුසලාන සංචාරයට අහිතකර බලපෑමක් වූ අතර අමතරව, ක්‍රීඩකයකු සම්බන්ධයෙන් වෙනත් සිද්ධීන්ද ඇතිවූ අතර, සාමාන්‍ය ක්‍රියාවලියේ කණ්ඩායම් කළමණාකරනය විසින් සහ පසුව ශ්‍රී ලංකා ක්‍රිකට් හි පරිපාලනය විසින් ගන්නා ලද විනය ක්‍රියාමාර්ග මගින් ඒ සම්බන්ධයෙන් නිසි කටයුතු කරන ලදී.

16. ඉන් අනතුරුව, අභිරුචියන් ඇති තනි පුද්ගලයන් විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි බලය අත්කර ගැනීම පිණිස හොඳින් සංවිධානය කල සහ අරමුණු සහගත ක්‍රියාවලියක් ක්‍රියාවට නංවන ලදී. මෙම කණ්ඩායමට මැතිවරණ ක්‍රියාවලිය මගින් තොරා පත්වීමට හැකියාවක් නොමැති පිරිසක් ඇතුලත් විය. ඔවුන්ගේ උපාය මාර්ගයේ වුයේ එක් පසකින් ක්‍රීඩකයන්ගේ චිත්ත ධෛර්‍යය හැල්ලුවට ලක්කිරීම සහ විනාශ කිරීම සහ අනෙක් පසින් ශ්‍රී ලංකා ක්‍රිකට් හි පරිපාලනයට එරෙහිව අසත්‍ය සහ ද්වේෂ සහගත චෝදනා එල්ල කිරීමයි.

17. ආනුශංගිකව, ඔස්ට්‍රේලියානු තරගාවලියේ උද්දේශිත සිදුවීම සහ සම්බන්ධිත ගැටලු පිළිබඳව විමර්ශනය කිරීම සඳහා වූ පංච පුද්ගල විශේෂ විමර්ශන මඩුල්ලක් ක්‍රීඩා ඇමතිවරයා විසින් පත්කරන ලදී. විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු සරෝජිනි කුසලා වීරවර්ධනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් පංච පුද්ගල මඩුල්ල විසින් පවරන ලද විමර්ශනයට ප්‍රතිචාර වශයෙන් දින රහිත වාර්තාවක් භාරදෙන ලදී.

*පංච පුද්ගල මඩුල්ලේ වාර්තාවේ සත්‍ය පිටපතක් පැමිණිලිකරුවන් <u>"P4"</u> වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

18. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P4 වශයෙන් ලකුණු කර ඇති එකී වාර්තාව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අභියාචනාධිකරණයේ අංක CA/W/27/2023 මගින් අභියෝගයට ලක් කරන ලද බවත්, සහ ශ්‍රී ලංකා ක්‍රිකට්හි සැලකිරීම් වලින් අනතුරුව අභියාචනාධිකරණය විසින් 2023.02.01 වන දින ක්‍රීඩා ඇමතිවරයා ඇතුළු වගඋත්තරකරුවන් වෙත විධිමත් නොතිසි නිකුත් කරන ලද බවත්, එසේ වුවත්, ශ්‍රී ලංකා

ක්‍රිකට් ආයාතනයට එරෙහි එකී චෝදනාවන් විමර්ශනය සඳහා විගණකාධිපතිවරයා වෙතට යොමු කර ඇති බවට අධිකරණය වෙතට දැනුම් දෙනු ලැබූ බවත්ය.

*පැමිණිලිකරුවන්, එකී අංක CA/W/27/2023 නඩුවේ පෙත්සම සහ 2023/02/01 දිනැති එකී කාර්ය සටහන් හි සත්‍ය පිටපත් පිළිවලින් "P5(a)" සහ "P5(b)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

**ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නිදහසට හේතු දක්වන තුරු ප්‍රසිද්ධ නොකල යුතු වූ විගණන කෙටුම්පත් වාර්තාව**

19. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විශේෂ විගණන කෙටුම්පත් වාර්තාවේ සම්බන්ධයෙන් ලිපියේ දින සිට දින 14ක් ඇතුළත නිදහසට හේතු සම්පාදනය කල යුතු බව, 2023 ජුනි 14 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය විගණකාධිපතිවරයා විසින් දැනුම් දුන් බවයි.

*පැමිණිලිකරුවන්, 2023/06/19 දිනැති ලිපියේ පිටපත "P6" වශයෙන්ද, විශේෂ විගණන කෙටුමපත් වාර්තාව පිටපත "P7" වශයෙන්ද ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

20. P6 වශයෙන් ලකුණු කර ඇති එකී ආවරණ ලිපියෙහි විශේෂිතවම මෙසේ සඳහන් කර තිබුනි

> 2022 ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ T20 ලෝක කුසලානය (පිරිමි) තරගාවලිය ආශ්‍රිත විශේෂ විගණන
>
> 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 13 වගන්තිය පරිදි පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට අපේක්ෂිත යථෝක්ත වාතාවේ කෙටුම්පතක් මේ සමා'ග එවා ඇත.
>
> 2. **මෙම වාර්තාවේ සාවද්‍ය හෝ එකගවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් මෙම ලිපියේ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.**
>
> 3. ඉහත සඳහන් පරිදි දින 14 ක් ඇතුළත ඔබගෙන් පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු වලට ඔබ එකග වූ ලෙස සලකා එම

වාර්තාවේ කරුණු වලට ඔබ එකග වූ ලෙස සලකා එම වාර්තාව පදනම් කරගෙන වසාන වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

21. P6 වශයෙන් ලකුණු කර ඇති විගණකාධිපතිවරයාගේ ලිපියෙන් පැහැදිලිවම සාක්ෂාත් වනුයේ, එකී කෙටුම්පත් වාර්තාව ප්‍රසිද්ධ කිරීමට පෙර එහි අඩංගු කරුණු පිළිබඳව නිදහසට හේතු දැක්වීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත අවස්ථාවක් සලසා දී ඇති බවයි. විගණකාධිපතිවරයා විසින් වැඩිදුරටත් දක්වා ඇත්තේ, එකී වාර්තාවේ සාවද්‍ය හෝ එකගවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීමට මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් එකී ලිපියේ දින සිට දින 14 ක් ඇතුළත් විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු බවයි.

22. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් 2023 ජුනි 23 දිනැති ලිපිය මගින්, P6 වශයෙන් ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාවට ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2023 අගෝස්තු 22 දින දක්වා වැඩිපුර කාලයක් අවශ්‍ය බවට ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දුන් බවයි.

*පැමිණිලිකරුවන්, 2023/06/23 දිනැති ලිපියේ පිටපත "P8(a)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

23. පැමිණිලිකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විගණන කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහාවූ කාලය දීර්ඝ කිරීම පිළිබඳව මේ වන තුරු ඔවුන්ට ජාතික විගණන කාර්යාලයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුනු බව ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2023 ජුලි 18 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් දැනුවත් කරන ලද බවත්, **ක්‍රීඩා සහ තරුණු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවධාරණ කර සිටින ලද්දේ, එකී වාර්තාව විගණකාධිපතිවරයාගේ වාර්තාව කෙටුම්පත් සංස්කරණයක් පමණක් බවත් සහ එහෙයින් එහි රහස්‍යභාවය රැකිය යුතු බවත්ය**.

*පැමිණිලිකරුවන් එකී 2023/07/18 දිනැති ලිපියේ සහය පිටපත "P8(b)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

24. පැමිණිලිකරුවෙන් ප්‍රකාශ කර සිටින්නේ, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විගණන කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් ප්‍රතිචාරය දැක්වීම සඳහා **ජාතික විගණන කාර්යාලය විසින් 2023 ජුලි 26 දින දක්වා කාල දීගුවක් ලබාදීමට එකගවී ඇති බව ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ** ලේකම්වරයා විසින් 2023 ජුලි 21 දිනැති

ලිපියෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් දැනුවත් කල බවත් සහ එකී විශේෂ විගණන කෙටුම්පත් වාර්තාවට පැමිණිලිකරුවන් විසින් 2023 ජූලි 25 වන දින හෝ ඊට පූර්ව ප්‍රතිචාර දැක්විය යුතු යැයි නියම කල බවත්ය. තවද, **ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එකී විශේෂ විගණන කෙටුම්පත් වාර්තාවේ රහස්‍යභාවය රැකීමේ වැදගත්කම අවධාරණය කර සිටින ලදී.**

*පැමිණිලිකරුවන් එකී 2023/07/21 දිනැති ලිපියේ සත්‍ය පිටපත "P9" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

25. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා ක්‍රිකට් හි ලේකම්වරයාගේ අත්සනින් යුතු 2023 ජූලි 21 වන දිනැති ලිපිය මගින්, එහි දක්වා ඇති හේතූන් මත 2023.07.25 වන දින වන විට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හැකියාවක් නොමැති බව ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දෙමින් එකී නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට තවත් සති තුනක කාලයක් ඉල්ලා සිටි බවයි.

*පැමිණිලිකරුවන් එකී 2023/07/21 දිනැති ලිපියේ පිටපත "P10" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

26. පැමිණිලිකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය විසින් 2023.07.24 වන දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් විගණකාධිපතිවරයා වෙත ලිපියක් යවමින්, හේතු දැක්වීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත වැඩිදුර සති තුනක කාල දීගුවක් ලබාදීම නිර්දේශ කර සිටි බවයි.

*පැමිණිලිකරුවන් එකී 2023/07/24 දිනැති ලිපියේ පිටපත "P11" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

27. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P7 වශයෙන් ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් අවශ්‍ය හේතු දැක්වීම සඳහා විගණකාධිපතිවරයා විසින් 2023.08.16 දින තෙක් කාල දීගුවක් ලබාදී ඇති බව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුත් 2023 ජූලි 27 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත දැනුම් දුන් බවත්, විගණකාධිපතිවරයාගෙන් ලද ලිපියද එයට අමුණා තිබූ බවත්ය.

*පැමිණිලිකරුවන්, 2023 ජූලි 27 දිනැති ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය සහ 2023 ජූලි 27 දිනැති විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ලිපි වල ලිපියේ සත්‍ය පිටපත් පිලිවෙලින් "P12(a)" සහ "P12(b)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

28. එහෙයින්, බැලූ බැල්මටම සාක්ෂාත් වනුයේ, P7 වශයෙන් ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් හේතු දැක්වීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විගණකාධිපතිවරයා විසින් 2023/08/16 දින දක්වා කාල දීගුවක් ලබාදී ඇති බවත්, **එබැවින් එකී විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව ප්‍රසිද්ධ කල නොහැකි බවත්ය.**

**<u>විත්තිකරු විසින් විගණන කෙටුම්පත් වාර්තාව නීතිවිරෝධීව සහ/හෝ අනීතිකව සන්තකයේ තබා ගැනීම සහ ප්‍රසිද්ධ කිරීම</u>**

29. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P6 වශයෙන් ලකුණු කර ඇති විගණකාධිපතිවරයා විසින් එවන ලද ලිපිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් නිදහසනට හේතු දක්වන තුරු P7 වශයෙන් ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව මහජනතාව වෙත හෙළිදරව් කිරීම හෝ මුද්‍රාහැරීම සිදුකල නොහැකිය. එහෙයින්, විගණකාධිපතිවරයා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් එකී විශේෂ විගණන කෙටුම්පත් වාර්තා පැහැදිලිවම රහස්‍ය බවට සලකා ඇත.

30. කරුණු එසේ වුවද, විත්තිකරු විසින් අනාවරණය නොකරන ලද ස්ථානයකින් එකී ලේඛනය නීතිවිරෝධීයව සහ/හෝ වංචනිකව අත්කරගෙන සහ/හෝ පැහැර ගනිමින් 2023.07.23 වන දින මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා එහිදී එකී ලේඛනයේ අඩංගු කරුණු අනාවරණය කිරීමට එරෙහි විගණකාධිපතිවරයාගේ සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රකාශිත තහනම නොතකා, එහි අඩංගු කරුණු ප්‍රසිද්ධියේ අනාවරණය කරමින් කරුණු විකෘති කරමින් සහ අමූලික අසත්‍ය ලෙස එය කියවන ලද අතර, වැඩිදුරටත් එකී වාර්තාව ගැන සඳහන් කරමින් P7 වශයෙන් ලකුණු කර ඇති එකී වාර්තාවේ අඩංගු නොවූ අපකීර්තිකර සහ අසත්‍ය ප්‍රකාශයන් කර ඇත. පැමිණිලිකරුවෝ ප්‍රකාශ කර සිටින්නේ මෙහි මින්මතු සඳහන් කරනු ලබන ප්‍රතිලේඛන (transcripts) ප්‍රමාණයෙන් අතිවිශාල බැවින්, විත්තිකරුගේ මාධ්‍ය ප්‍රකාශයේ තෝරාගත් උපුටන පැමිණිලිකරුවන් විසින් මින්මතු ප්‍රතිඋත්පාදනය කර සිටින අතර, ශූභුඩින් දැක්වීම සඳහා පහත සඳහන් පරිදි මෙහිදී ඉස්මතු කර දැක්වෙනු ඇත:-

> "තමන්ගේ හොරකම් වංචා ටික වහගන්න, තමන් කරන ජඩ වැඩ ටික වහගන්න මේ රටේ ජනතාවගේ ගෞරවයට පාත්‍ර වෙලා ඉන්න ක්‍රීඩකයෝ ඉස්සරහින් තියා ගන්න එපා කියලා අපි ක්‍රිකට් පාලක මණ්ඩලයට මේ වෙලාවේ මතක් කරලා දෙන්න කැමති......"
>
> "අද වෙනකොට කිසිම ක්‍රීඩා අමාත්‍යවරයෙකුට බැරිවුනා ක්‍රිකට් පාලක මණ්ඩලයට පත්වෙන සභාපතිවරයගේ ඉඳල කමිටුව පත්වෙන්න විනිවිද භාවයක් ඇති කරන්න. ඔබ කිව්වොත් පිලිගන්න ඕනි. ඔබ ඒ ගැන හොයල බලනවද? මේ පත්කිරීමට අදාල ඡන්දය දෙන බොහෝ ක්‍රීඩා සමාජ වලට සන්තෝෂම් දෙනඑක හැර ඒ ක්‍රීඩා සමාජ දියුණු කරන්න, ඒ ක්‍රීඩා සමාජ තුලින් ක්‍රීඩකයො මේ රටේ ජාතික තලයට අරගෙන එන වැඩ සටහනක් කරන්නෙ නැහැ. මැතිවරණය ජයග්‍රහණය කරන්න

හැමදාම එකයි. සන්තෝෂම් දිල ජන්දය ඇඳ ගන්නව. පාලක අධිකාරියට පත්වෙන්නෙ ඇත්තම සුදුස්සෙක් නෙමෙයි. සල්ලි ටිකක් වැඩිපුර වියදම් කරල ජාවාරම් ජාවාරම්කාරයො ටිකක් හදාගන්න පුලුවන්. ජාවාරම්කාරයො ඒක මේ කරන ක්‍රියාවලින් පැහැදිලියිනේ....."

"අද ක්‍රිකට්වල අපි ඉන්න තැනට හේතුවුනේ ක්‍රිකට් ක්‍රීඩාව භාරගත්තු මහත්වරුන්ගෙ වැඩ සටහන මේකයි......"

"මේකයි. ක්‍රිකට් ක්‍රීඩකයෝ තිස්දෙකක් මේ තරඟාවලියට ගිහිල්ල තියෙනව. ක්‍රිකට් ක්‍රීඩකයන්ට පහසුකම් ලබාදීම විය යුතුයි. ඒ වෙනුවෙන් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සම්පූර්ණ මුදල් ලබා දෙනව. ඒ මුදලුත් අවභාවිතා වෙලා තියෙනවා.මේ ක්‍රීඩකයන්ට අමතරව තව දහහත් දෙනෙක් කිසිදු පදනමක් නැති, මේකට සම්බන්ධ නැති දහහත් දෙනෙකුට යන්න ලිපි නිකුත් කරල. මොකද ඕස්ට්‍රේලියාවට යන්න වීස එකක් ගන්න එක ඒ තරම් පහසු වැඩක් නෙවෙයි. ඒ වීස එක ගන්න ලිපි නිකුත් කරන්න කටයුතු කරල තියෙනව. දහහත් දෙනා වෙනුවෙන් අමාත්‍යාංශයෙ 2022 ජුලි 07 වෙනිද/ 11 වෙනි විධායක කමිටු රැස්වීමෙදි යෝජනා කරල තියෙනව. මේ ක්‍රිකට් ආයතනයෙ 2022 ජුලි 07 11 වෙනි විධායක කමිටු රැස්වීමෙදි ඕස්ට්‍රේලියාවට යාමට ඒමට ගුවන් ටිකට් පත් දෙන්න ව්‍යාපාරික පන්තියෙ දින 10 ක නවාතැන් දෙන්න. අභ්‍යන්තර ගමන්වල යාමට වියදම් කරන්න දෙන්න. වීස ගාස්තු ගෙවන්න. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය දරන්න ඕනි කියල ඉස්සෙල්ල එයාල සම්මත කරගෙන. එතකොට මේ විධායක කමිටුව ඊට පස්සෙ ක්‍රීඩා අමාත්‍යවරයාට අමතනව ලිපියකින්. 2022 සැප්තැම්බර් 20 වන දින SLC/SEC/ICC/T20 World Cup/EXCO/2022 කියන ලිපිය ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් ඉල්ලීමක් කරනව මේකට අවශ්‍ය නිර්දේශය දෙන්න කියල. ඒ අනුව වීසා ලිපි නිකුත් කිරීම ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ජනතාව අතර නොඒම පිලිබඳව අපි කණගාටු වෙනව. අපි දේශපාලනඥකු විදිහට අපි කථා කරන්නෙ මේ රටේ දේශපාලන ධාරාවතුල වෙන දේවල් විතරයි. මහ විශාල නිලධාරී එකතුවෙලා මේ වගෙ ආයතන තුල සභාපතිවරුන් ස්වාධීනත්වයක් පෙන්නගෙන කරන ජාවාරම් සමාජගත නොවීම පිලිබද කණගාටු වෙනව. මේ කියපු කට්ටිය අර අනිත් කට්ටිය මේ සියලු දෙනාට වීස ලිපි නිකුත් කරල තියෙනව......"

"බලන්න ඕස්ට්‍රේලියාව ටුවර් එකේ මීඩියා එක්කන් යන කණ්ඩායමේ ශ්‍රී ලංකා රූපවාහිනිය ඉල්ලීමක් කරනව දෙන්නෙ නෑ අවස්ථාව. ස්වාධීන රූපවාහිනිය ඉල්ලීමක් කරනව දෙන්නෙ නැහැ අවස්ථාව. එතකොට ජාතික නාලිකා දෙකවත් අරන් යන්න නැති විදිහට කටයුතු කරන්න මොකක්ද තියෙන භයිය......"

*පැමිණිලිකරුවන් 2023/07/23 දින පැවති මාධ්‍ය හමුවේ සහ/හෝ එහි අන්තර්ගතයේ සම්පූර්ණ ප්‍රතිලේඛනයක් (full transcript) පිටපත සහ ඩීවීඩී කරණයක් පිලවලින් <u>"P13(a)"</u> සහ <u>"P13(b)"</u> වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

31. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P13(a) සහ P13(b) වශයෙන් ලකුණු කර ඇති ලේඛනයෙන්හි අඩංගු චෝදනා සහ/හෝ ප්‍රකාශයන් ව්‍යක්තව සහ ව්‍යංගයෙන් යන

දෙයාකාරයෙන්ම අසත්‍ය සහ එකී ස්වභාවයෙන් අපහාසාත්මක බවයි. මෙම අපහාසාත්මක අංගයෙහි පහත සදහන් කරුණු ඇතුලත් අතර ඒවාට සීමා නොවේ:

අ) පැමිණිලිකරු ඇතුළු, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි නිළධාරීන් විසින් ආයතනයේ අරමුදල් අයුතු ලෙස අත්කරගෙන ඇති බවට හැගීමක් මතුකර දක්වන බවත්,

ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම අරමුදල් ඒවායේ චේතනිය භාවිතය වෙනුවට තුන්වන පාර්ශවයන් සදහා වැයකර ඇති බවට හැගීමක් උත්පාදනය කරන බවත්,

ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම ක්‍රිකට් ක්‍රීඩකයන්ට ප්‍රමාණවත් සැලකිල්ලක් ලබා නොදෙන බවට හැ!ගීමක් ප්‍රකාශයට පත්කරන බවත්,

ඈ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වැරදිකරුවන් ලෙස හංවඩු ගසන ලද පුද්ගලයන්ගෙන් සමන්විත බවට ආරෝපණය කරන බවත්,

ඉ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුවට ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලියකට සහභාගි වීමට අවශ්‍යතාවක් නොමැති බවට අසත්‍ය අදහසක් මතුකරන බවත්ය.

<u>2023.07.24 දිනැති දිවයින පුවත්පතේ ලිපිය</u>

32. ඉන් අනතුරුව, විත්තිකරු සම්බන්ධ කරගෙන සකසන ලද පුවත් ලිපියක් 2023/07/24 දින දිවයින පුවත්පතේ පළ කරන්නට යෙදී ඇත. මෙම පුවත් ලිපියෙන් විත්තිකරු සම්පූර්ණ අසත්‍ය සහ අපහාසාත්මක ප්‍රකාශයන් කර ඇති අතර, ඒ අතුරින් ඔස්ට්‍රේලියාවේ ගතකල කාලයක සදහාවු 1 වන පැමිණිලිකරුගේ පවුලේ සාමාජිකයන්ගේ වියදම් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ආවරණ කල බවට වු ප්‍රකාශයක්ද ඇතුලත් විය.

33. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P7 වශයෙන් ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාවේ කිසිදු තැනක 1 වන පැමිණිලිකරුගේ පවුලේ සාමාජිකයන්ගේ වියදම් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් දරණ ලද බවට සදහනක් නොමැති බවයි.

34. එකී පුවත් ලිපියෙන් එහෙයින් මෙසේ ස!දහන් කර ඇත:

"ක්‍රිකට් දියුණුවට තිබූ මුදල් විධායක කමිටුවේ සතුට වෙනුවෙන් යොදවලා

-පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ-

රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව සඳහා යෙදවීමට නියමිත මුදල් විධායක කමිටුවේ සාමාජිකයන්ගේ සතුට සහ ප්‍රයෝජනය සඳහා වෙනුවෙන් යොදවා ඇති බව සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු දිස්ත්‍රික් මන්ත්‍රී හේෂා විතානගේ මහතා කොළඹ දී ඊයේ (23 වැනිදා) මාධ්‍ය හමුවක් කැඳවමින් ප්‍රකාශ කළේ ය.

විගණන වාර්තාවක කරුණු පෙන්වා දෙමින් විපක්ෂ මන්ත්‍රී වරයා මේ බව කියා සිටි අතර ඊට අදාළ සියලු සාක්ෂි තමා සතුව ඇති බවත් මෙම ලේඛන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට අදහස් කරන බවත් මන්ත්‍රීවරයා එහිදී පැවසිය.

මන්ත්‍රී වරයා පවසන පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටු සමාජිකයන් පසුගිය මාසේ ඕස්ට්‍රේලියාවේ පැවති පන්දු වාර 20-20 ලෝක කුසලාන තරගාවලියේදී ගුවන් ටිකට් පත් මිළදිගැනීමට සහ දීමනා ලෙස රු. මිලියන 67ක් වියදම් කර තිබේ.

"ක්‍රිකට් යනු සෑම ශ්‍රීලාංකිකයෙකුම ආදරය කරන ක්‍රීඩාවකි. ක්‍රීඩාවේ වියදම් පියවා ගැනීමට නොහැකිව දගලන පාසල් ඕනේ තරම් ඇතත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මුදල් තම අවශ්‍යතා සඳහා යොදවනවා." මන්ත්‍රීවරයා කොළඹ දී පැවති එම මාධ්‍ය හමුවේදී තවදුරටත් චෝදනා කළේ ය.

"ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපති ශම්මි සිල්වා පමණක් ලෝක කුසලානය සඳහා මිලියන 11කට අධික මුදලක් වෙන්කර තිබෙනවා. ඔහු ඕස්ට්‍රේලියාවට යෑම ගැන මට ප්‍රශ්නයක් නැහැ. නමුත් **මෙතරම් මුදලක් වියදම් කරන්නේ ඇයි ද යන්න මගේ ප්‍රශ්නයයි. ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිවරයා සමග ඔහුගේ බිරිඳ සහ බිරිඳගේ පවුලේ සාමාජිකයින් ඔහු සමග ශ්‍රී ලංකා ක්‍රිකට් අරමුදල මත ඕස්ට්‍රේලියාවට ගොස් තිබෙනවා. ඒක ක්‍රිකට් නෙවෙයි."** මන්ත්‍රීවරයා පෙන්වා දුන්නේ ය.

"මම **මේ කාරණය ගෙන එන්නේ කිසිම ද්වේශයකින් තොරව ක්‍රීඩාව නිවැරදි මාර්ගයට ගැනීමටයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක නිලධාරීයා ක්‍රිකට් ක්‍රීඩාවට කිසිදු සම්බන්දයක් නොමැති පුද්ගලයන් 17 දෙනෙකුට ඕස්ට්‍රේලියාවට වීසා ලබා ගැනීමට ලිපි නිකුත් කර තිබෙනවා.** ඔවුන්ගෙන් එක් අයෙකු ආපසු පැමිණ නැහැ. මේක රටට කලු පැල්ලමක් වගේම ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවටත් කලු පැල්ලමක්." මන්ත්‍රීවරයා වැඩි දුරටත් පැවසිය.

"අපේ ක්‍රිකට් ක්‍රීඩාව අවල් වෙලා. අපි පක්ෂයක් විදිහට පොරොන්දු වෙනවා මේ කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා මේ ගැන විවාද කරන්න. ඊට අදාල සියලු සාක්ෂි මා සතුව තිබෙනවා."

.."

*පැමිණිලිකරුවන්, 2023/07/24 දිනැති එකී පුවත් ලිපියේ සත්‍ය පිටපත "P14" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

35. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P14 වශයෙන් ලකුණු කර ඇති එකී ලේඛනයෙහි අඩංගු චෝදනා සහ/හෝ ප්‍රකාශයන් ව්‍යක්තව සහ ව්‍යංගයෙන් යන දෙයාකාරයෙන්ම අසත්‍ය සහ එකී ස්වභාවයෙන් අපහාසාත්මක බවයි. මෙම අපහාසාත්මක අංගයෙහි පහත සඳහන් කරුණු ඇතුලත් අතර ඒවාට සීමා නොවේ:

අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම අරමුදල් ඒවායේ චේතනීය භාවිතය වෙනුවට, 1 වන පැමිණිලිකරුගේ පවුලේ සාමාජිකයන් ඇතුළු තුන්වන පාර්ශවයන් සඳහා වැයකර ඇති බවට හැගීමක් උත්පාදනය කරන බවත්,

ආ) පැමිණිලිකරුවන් ඇතුළු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිළධාරීන් ආයතනයේ අරමුදල් අයුතු ලෙස අත්කර ගැනීමේ යෙදී ඇති බවට හැඟීමක් මතු කරන බවත්,

ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වැරදිකරුවන් ලෙස හංවඩු ගසන ලද පුද්ගලයන්ගෙන් සමන්විත බවට ආරෝපණය කරන බවත්,

ඈ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුවට ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලියකට සහභාගි වීමට අවශ්‍යතාවක් නොමැති බවට අසත්‍ය අදහසක් මතුකරන බවත්ය.

<u>2023/07/25 වන දින විත්තිකරු විසින් ලබාදෙන ලද හඬ විවරය (voice cut)</u>

36. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, P7 වශයෙන් ලකුණු කර ඇති වාර්තාව පදනම් කරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කිරීමෙන් අනතුරුව, විත්තිකරු විසින් 2023/07/26 වන දින ශ්‍රී ලංකා ක්‍රිකට් අවමානයට පත්කිරීම සඳහා කොළඹ 01, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු භූමියේ දි පහත සඳහන් අසත්‍ය ප්‍රකාශ කර ඇති බවයි :

37. එකී අපහාසාත්මක ප්‍රකාශය එහෙයින් මෙසේ කියවේ:

ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනය පිළිබඳව ඉදිරිපත් වෙලා තියෙන විගණන වාර්තාව කියන මේ ලේඛනය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කරන්න අවශ්‍ය වුණා. මොකද මේ ලේඛනයේ නිත්‍යානුකූල බාවය පිළිබඳව සහතිකයක් ගන්න අවශ්‍යයි. මේ වෙනකොට කිසිම ප්‍රකාශයක් සිදුවෙලා වත් පාර්ලිමේන්තුවට සභාගත කරලත් නැති නිසා. ඒ නිසා මේ කෙටුම්පත තුළ කියෙන කාරනා පිළිබඳව අපි විශේෂයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කර, ඒ දැන්වත් කිරීම හරහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බාර ස්ථානාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරා මේ ලේඛනයට අවශ්‍ය පරීක්ෂණ කටයුතු කරගෙන යාම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරද්දි ඒ අවශ්‍ය ලිපි ලේඛන තියෙන්නේ ක්‍රිකට් ආයතනය සතුව. ඉතින් අපිට සැකයක් තියෙනවා මේ ලේඛනය තුල හඳුනාගෙන තියෙන කාරනා පිළිබඳව සත්‍ය අසත්‍යතාවය පිළිබඳව විමර්ශනය කිරීමේ දි අවශ්‍ය උදව් වන උපකාරි වන තොරතුරු ක්‍රිකට් ආයතනය සතු ලිපි ලේඛන අස්ථානගත වීමේ අවධානමක් තියෙනවා. ඒ නිසා කරුණාකර ඉතා ඉක්මණින් ඒ ලිපි ලේඛන අදාල පරීක්ෂන කටයුතු සහයෝගය ලබා ගැනිම සඳහා යම් ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියන ඉල්ලිම අපි කළා. ඒ වගේම අපි මේ වාර්ථාව **කියවගෙන යනකොට මේ වාර්ථාව තුළ අඩංගවන කරුණුත් එක්ක අපිට පැහැදිලිවම පේනවා ශ්‍රී ලංකා ක්‍රිකට් අයතනය ආයේ මෙතනින් එහාට ගමනක් යන්න බලාපොරොත්තුවක් නැහැ. ඔවුන්ගේ පෞද්ගලික සුඛ විවරණය මේ තාවකාලික ගමනක් තමයි ගිහිල්ලා තියෙන්නේ. ඉතින් ඔවුන්ට මෙතනින් එහාටත් මේ රටේ** ක්‍රිඩාව නංවන්න බලාපොරොත්තුවක් නැති පිරිසක් නිසා මෙතන මේ නිර්මාණය වන ගැටලුත් එක්ක මේ පරීක්ෂනය හරහා මේ රටට ඔප්පු වන කාරණාවල් එක්ක මන් හිතනවා ක්‍රිකට් අයතනය වර්තමාන පාලන අධිකාරිය මේ තියන තොරතුරු වසන් කරලා නැත්තම් ක්‍රිකට් අයතනය තුල තියන පරිපාලනය පවා බිඳවැටිමට පවා අවශ්‍ය පියවර ගන්න ඉඩ තියෙනවා මේ සිද්ධ වෙලා තියන කාරනාවන් නිසා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා ඉතා කඩිනමින්. මොකද මාධ්‍ය වලට වාරන නියෝග නිකුත් කරලා ඉවර වෙලා තමන්ගේ ගමන යන්න පවා සෘජු බාවයක් තියන පරිපාලනයක් නම් තියෙන්නේ, එතනින් එහාට ඕනේ දෙයක් කරන්න පුලුවන් කියලා දන්නවා. රටේ

මාධ්‍ය වලට තියෙන අවස්ථාව අහිම කරගෙන තමයි ගමන යන්න උත්සහ කරන ආයතනයක් පිළිබඳව රටේ ජනතාවට විශ්වාස කරන්න බෑ. මේ රටේ මූලික අයිතිවාසිකමක් විදිහට ව්‍යවස්ථාවෙන්ම දීලා තියෙනවා තොරතුරු දැනගැනීමේ අයිතිය. තොරතුරු දැනගැනීමේ අයිතිය අවහිර කරලා ඉවරවෙලා යන්න හදන රටේ රාජ්‍ය ආයතනයක්, මං හිතන්නේ ඉදිරි ගමනක් යෑම පිළිබඳ විශ්වාසයක් තියෙනවා. ඉතින් මං බලාපොරොත්තු වෙනවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා මේ රටේ ක්‍රිකට් ලෝලීන්ට ක්‍රිකට් වලට ආදරය කරන සියලුම දෙනාට සහ රටේ නීතිය ගැන දන්න පුරවැසියන්ට සාධාරණයක් දකින්න පුලුවන් කඩිනම් පියවර ගනී කියලා.

ප්‍ර: ඒ වගේම LPL තරඟාවලිය ලෝක තරඟාවලිය ඉදිරියේ දී පැවැත්වෙනවා. ඉතින් ක්‍රීඩකයන්ට යම් බලපෑමක් ඇති වෙනව නේද මේකෙන්?

උ: නෑ ක්‍රීඩකයින් මම හිතන්නේ මේ ගැන සතුටු වෙයි. ක්‍රීඩකයින්ට කියා ගන්න බැරි දෙයක් තමයි අපි මේ කියන්නේ. ක්‍රීඩකයින්ගේ මානසික සුවයක් ඇතිව තමන්ගේ ක්‍රීඩා කටයුතු වල නිරත වෙන්න පුලුවන් පාලන අධිකාරියක් නිර්මාණය කිරීම තමයි අපේ වගකීම සහ ප්‍රයත්නය. ඉතින් අපි හිතනවා ක්‍රීඩකයෝ සියලු දෙනා පුද්ගලිකව සතුටු වෙයි, ඔවුන් දන්න රට නොදන්න සමාජය තුල ඔවුන්ට මේක අරගෙන යන්න පුලුවන් හැකියාවක් නොතිබ්බ්ච කාරණාවක් සමාජ ගත වෙලා, සමාජය තුලින් එයට උත්තර හොයනවා. ඒ නිසා මේ සෙල්ලම නතර වෙයි කියන විශ්වාසය උඩ ඉන්නේ.

ප්‍ර: ඔය හෙළිදරව්වෙන් පස්සේ අලුතින් මොකුත් එළියට ඇවිල්ලා තියනවද අලුතෙන්?

උ: නෑ අලුතින් නෙවෙයි. හෙළිදරව්වක් කරාට පස්සේ ඒකට චෝදනාවට ලක් වන පුද්ගලයෝ ප්‍රකාශයක් කරන්න එපායෙ. තමන්ගේ ගෞරවය රැකගන්න හරි. අපිට එහෙමවත් පෙන්නේ නෑනේ. දැන් පැහැදිලි මේක ඇතුලේ මේ සිද්ධි ගොඩක් තියෙනවා. තමන්ට ඕනේ විදියට තමන් ක්‍රියාත්මක කළා කියන කාරනාව දන්න නිසා අද ප්‍රකාශය නැත්තේ. ඒ නිසා ආයෙත් අලුතින් මම හිතන්නේ කියන්න දෙයක් නෑ.

*පැමිණිලිකරුවන් 2023/07/25 දිනැති හඬ විවරයේ පිටපත්ලේඛනයක් (transcript) සහ ඩීවීඩී කරණයක් පිළිවලින් "P15(a)" සහ "P15(b)" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

38. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, "P15(a)" සහ "P15(b)" වශයෙන් ලකුණු කර ඇති එකී ලේඛනයන්හි අඩංගු චෝදනා සහ/හෝ ප්‍රකාශයන් ව්‍යක්තව සහ ව්‍යංගයෙන් යන දෙයාකාරයෙන්ම අසත්‍ය සහ එකී ස්වභාවයෙන් අපහාසාත්මක බවයි. මෙම අපහාසාත්මක අංගයෙහි පහත සඳහන් කරුණු ඇතුලත් අතර ඒවාට සීමා නොවේ:

අ) පැමිණිලිකරු ඇතුළු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිළධාරීන් ආයතනයේ අරමුදල් අයුතු ලෙස අත්කර ගැනීමේ යෙදී ඇති බවට හැඟීමක් මතු කරන බවත්,

ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වැරදිකරුවන් ලෙස හංවඩු ගසන ලද තනි පුද්ගලයන්ගෙන් සමන්විත බවට ආරෝපණය කරන බවත්ය.

**ඔස්ට්‍රේලියාවේ පැවති T20 ලෝක කුසලාන තර!ගාවලියට ශ්‍රී ලංකා ක්‍රිකට් හි නිළධාරීන් සහභාගී වීමට අදාල නියම සහ සත්‍ය පසුබිම**

39. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, පොදුවේ ලෝක කුසලාන තරගාවලියක් තුල ශ්‍රී ලංකා ක්‍රිකට් හි විධායක කමිටුව සහභාගී වීම තරගවලදී හුදෙක් ප්‍රේක්ෂයන් වීම ඉක්මවා යන්නක් බවයි. ඔවුන්ගේ සහභාගිත්වය තරගාවලිය පුරා ඔවුන්ගේ වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමේ තිරණාත්මක භූමිකාවක් වන්නා සේම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ නිලධාරීන්, අනෙකුත් ක්‍රිකට් ක්‍රීඩා කරන රටවල නියෝජිතයන්, සහ ප්‍රධාන අනුග්‍රාහකයන් සමග සම්බන්ධතාවන් ඇති කර ගැනීම කෙරහිද බලපාන බවයි. මෙම අන්තර්ක්‍රියාවලියන් (interactions) අනාගත සංචාරයන් අත්කර ගැනීම, තරග රෙගුලාසි පිළිබඳව සාකච්ජාවල නිරත වීම, අනුග්‍රාහක ගනුදෙනු ගිවිස ගැනීම, සහ ක්‍රිකට්වලට අදාල වෙනත් සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් යොමු වීම ආදිය පිළිබඳව උපරිම වැදගත්කමක් දරන්නේය.

40. එහෙයින් මෙම නිලධාරීන් පවතින හේතුන් මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සහ රටේ ගරුත්වය සහ කීර්තිය සුරක්ෂිත වන අයුරින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ නියෝජිතයන්, අනෙකුත් ක්‍රිකට් පාලක මණ්ඩල, සහ අනුග්‍රාහකයන් සමග කටයුතු කරමින් අන්තර්ක්‍රියාවලියේ යෙදෙති. එහෙයින්, ලෝකයේ දෙවෙනි ජනප්‍රිය ක්‍රීඩාව සම්බන්ධයෙන්වූ මෙම තිරණාත්මක අන්තර්ක්‍රියාවලියේදී වාසිදායක සංකල්පනයක් සහතික කිරීම පිණිස නවාතැන්, ගමන්බිමන් හෝ අඩුම තරමේ පෙනුම සම්බන්ධයෙන් සමහර ප්‍රමිතිගත මූලික අවශ්‍යතාවයන් පිළිපැදිය යුතුය.

**ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සිද්ධියක් ස!දහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් අනුපූරක ටිකට්පත් නිකුත් කිරීම සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අමතර ටිකට්පත් මිළදී ගැනීම**

41. තවද, සෑම ක්‍රිකට් කිඩාවේ නියැලි දේශයක් සඳහාම අනුපූරක සත්කාරක තරග ටිකට්පත් සැපයීම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සම්ප්‍රදායකි. මෙම ටිකට්පත් අනුග්‍රාහකයන්, ක්‍රීඩකයන්ගේ සහ නිළධාරීන්ගේ ඥාතීන් සහ දැන හඳුනන්නන් අතර බෙදා හැරීම සඳහා වේ. ICC අත්පොතට යටත්ව, මෙම ටිකට්පත් බෙදාහැරීම පිළිබඳ අභිමතය ශ්‍රී ලංකා ක්‍රිකට් සතුව පවතී. එසේ වුවත්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි පැවත එන හුරුකමක් අනුව, ජාතික කණ්ඩායම අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබිය හැකි යැයි අපේක්ෂාව මත, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අමතර ටිකට්පත් මිළදී ගැනීම සිදු කරන්නේය. තවද, ඉහත සඳහන් ප්‍රේක්ෂයකයන්ට ප්‍රායෝගිකව සහ ඵලදායී ලෙස ක්‍රීඩා කරන තරග සඳහා ටිකට්පත් තමන් විසින්ම මිළදී ගැනීමේදී අභියෝගයන් වලට මුහුණ දෙති. තරග ටිකට්පත් පිරිනැමීම, තරග පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයින්ට සහභාගී වීමට සහ ක්‍රීඩකයින් දිරිමත් කිරීමේ අරමුණින් සිදු කෙරේ.

*පැමිණිලිකරුවන් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් නිකුත් කරන ලද අත්පොතේ අදාළ කොටසේ සත්‍ය පිටපතක් "P16" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් වශයෙන් අයැද සිටිති.*

42. එහෙයින්, ඉහත සඳහන් උනන්දුවක් දක්වන ප්‍රේක්ෂයකයන්ගේ ඉල්ලීම මත ඔවුන්ගේ වීසා ඉල්ලුම්පත්‍ර වලට පහසුකම් සැපයීම සඳහා නිර්දේශ ලිපි නිකුත් **කිරීම පමණක්** ශ්‍රී ලංකා ක්‍රිකට් සුදානම් නමුත්, එසේකුදු වුවත්, **සැලකිය යුතු වැදගත් කරුණ වන්නේ**

- අ) ඔවුන්ගේ ගුවන් ටිකට්, වීසා ආවරණය කරන වියදම්
- ආ) නවාතැන් වියදම්,
- ඇ) ආහාර සම්බන්ධයෙන්වූ මොනයම් හෝ වියදමක්

**ආදී ඔවුන්ගේ කිසිදු වියදමක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නොදරණ බවයි.**
පැමිණිලිකරුවන් විශේෂිතවම ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා ක්‍රිකට් හි නිළධාරීන් සහ විධායක කමිටු සාමාජිකයන් සහ නිළධාරීන් දෙදෙනෙකුට පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගුවන් ටිකට්පත් සහ නවාතැන් සැපයූ අතර, වීසා සඳහා නිර්දේශ ලිපි ලබාදුන් පුද්ගලයන් සඳහා ගුවන් ටිකට්පත් වියදම් හෝ නවාතැන් වියදම් හෝ මෙනයම් මූල්‍යමය වියදමක් නොලැබුනු බවයි.

43. පැමිණිලිකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, P7 වශයෙන් ලකුණු කර ඇති එකී වාර්තාව පැමිණිලිකරුවන්ගේ ඉහත ස්ථාවරයට පටහැනි නොවන බවයි.

*පැමිණිලිකරුවන්, ඉහත කරුණු තහවුරු කරමින් ශ්‍රී ලංකා ක්‍රිකට් හි මූල්‍ය ප්‍රධානියාගේ දිවුරුම් ප්‍රකාශයක් "P17" වශයෙන් සහ මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

44. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම ප්‍රකාශනය මගින් පැමිණිලිකරුවන් රටේ ක්‍රිකට් ඒකායන පාලන කායක් වශයෙන් නියෝජනය වන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි බලතල සහ ක්‍රියාකාරකම් පිළිබඳව හිමිකම් පෑමක් කරන බවයි. මෙම ප්‍රකාශනයෙන් අගවන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම අරමුදල් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් දියුණු කිරීම සඳහා පරිපාලනය කිරීමේ සහ උපයෝගි කර ගැනීමේ වගකීම දරණ බවයි. මෙම අරමුදල් රට තුල ක්‍රිකට් වර්ධනය සහ දියුණුව සඳහා ආධාර කිරීමට නොයෙකුත් ආකාරයෙන් උපයෝගි කරගනු ලැබේ.

පැමිණිලිකරුවන්, එයට සාක්ෂියක් වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි මූල්‍ය අංශය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ P18" වශයෙන් මෙයට අමුණා මෙහිම කොටසක් වශයෙන් අයැද සිටිති.

45. අමතරව, ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නොයෙකුත් රජයේ ආයතන වෙත මූල්‍යමය ආධාර සපයා ඇත. මෙයින් ගම්‍යමාන වනුයේ ශ්‍රී ලංකා ක්‍රිකට් අවධානය යොමු කර ඇත්තේ ක්‍රිකට් ආශ්‍රිත ප්‍රතූක්තිකර්ම සඳහා පමණක් නොව ක්‍රීඩා, යටිතල පහසුකම් හෝ සමාජ සුභසාධනය ආදියට ආශ්‍රිත වෙනත් රජයේ ආයතන වෙතද සහයෝගය දිගු කර ඇති බවයි.

පැමිණිලිකරුවන්, පැමිණිලිකරුවන්, එයට සාක්ෂියක් වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි මූල්‍ය අංශය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ "P19" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් වශයෙන් අයැද සිටිති.

<u>ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ රෙගුලාසි</u>

46. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ පූර්ණ සාමාජිකයකු වශයෙන්, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ව්‍යවස්ථාවේ දක්වා ඇති සාමාජික බැඳියාවන් සහ විශේෂයෙන්ම පිළිවෙලින් 24 (සී) සහ (ඩී) හි දක්වා ඇති බැඳියාවන් සම්බන්ධයෙන් සෑම කල්හිදීම අඛණ්ඩ වගකීමක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත පැවරී ඇති බවයි.

(බී) 2.4(සී) වගන්තිය ප්‍රකාරව, සෑම සාමාජිකයෙක්ම තම විධායක මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා නිදහස් සහ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් සහතික කිරීමට බැ!ඳී සිටී.

(සී) 2.4(ඩී) වගන්තිය ප්‍රකාරව, සෑම සාමාජිකයකුම තම කටයුතු ස්වාධීනව පවත්වාගෙන යාමට සහ ක්‍රිකට් පාලනය, රෙගුලාසි සහ පරිපාලනය සම්බන්ධයෙන් කිසිදු රජයේ බාධකයක් නොවන බවට සහතික වීමට බැ!ඳී සිටී.

*පැමිණිලිකරුවෙන්, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ව්‍යාවස්ථාවේ සත්‍ය පිටපතක් "P20" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයන් වශයෙන් අයැද සිටිති.*

47. පැමිණිලිකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, ඉහතකී පරිදිවූ බැඳියාවන් උල්ලංඝනය කිරීමක් වුවහොත්, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සාමාජිකයන්ගේ සාමාජිකත්වය මුල් අවස්ථාවේදී අත්හිටුවීමකට සහ පසුව අවසන් කිරීමට ඉඩ ඇති බවත්ය.

48. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ මෑත අතීතයේදී, ක්‍රිකට් ක්‍රීඩාවට රජයේ බාධා පමුණුවීම් මත ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ පූර්ණ සාමාජිකයකු වන සිම්බාබ්වේ හි සාමාජිකත්වය අත්හිටුවන ලද බවයි.

*පැමිණිලිකරුවන් එය විදහා දැක්වෙන අන්තර්ජාල ලිපිහි සත්‍ය පිටපත් "P20" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටිති.*

49. පැමිණිලිකරුවන් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, නුදුරු අතීතයේදී ක්‍රීඩා අමාත්‍යවරයකු විසින් උද්දේශිතව (සංශෝධිත) 1973 අංක 25 දරණ ක්‍රීඩා නීතිය ප්‍රකාරව කටයුතු කරන බව හගවමින් අතුරු පාලන කමිටුවක් පත්කිරීම පිළිබඳව ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත දැඩි අනතුරු හැගවීමක් කල බවයි.

*එකී වර්ෂ 2022 නොවැම්බර් 11 දිනැති ලිපියේ සහ වර්ෂ 2022 නොවැම්බර් 25 දිනැති ලිපියේ සත්‍ය පිටපත් "P22" සහ "P23" වශයෙන් ලකුණු කර මෙයට අමුණා මෙහිම කොටසක් සහ අංගයක් වශයෙන් අයැද සිටී.*

50. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, දේශපාලකයකු වන විත්තිකරු සහ අභිරුචි උනන්දුවක් ඇති වෙනත් පාර්ශවයන් සත්‍යාපනය නොකරන ලද විගණන වාර්තාවක් පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් හි කටයුතු වලට බාධා පමුණුවන බවයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් එකී වාර්තාව සම්බන්ධයෙන් තවමත් තම හේතු දක්වා නොමැති බැවින්, පැමිණිලිකරුවන් දැඩිව විශ්වාස කරනුයේ අවසානයේදී ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනප්‍රිය ක්‍රීඩාව වන ක්‍රිකට්වලට සෘණාත්මක බලපෑමක් ඇති කරවන තදබල ආනිශංෂයන්ට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සහ එහි සාමාජිකයන්ට මුහුණ දීමට සිදුවනු ඇති බවයි.

51. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරු විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි කටයුතුවලට බාධා පමුණුවීමේ ද්වේශ චේතනාවෙන් පැමිණිලිකරුගේ කීර්තිය කෙලෙසීමේ සහ පොදු මහජනතාව හමුවේ පැමිණිලිකරුව වෛරයට, අපවාදයට සහ නින්දාවට පත්කිරීමේ චේතනාවෙන්, ද්වේශසහගත චේතනාවෙන් උවමනාවෙන්ම සිදුකරන ලද අපහාසාත්මක සහ අසත්‍ය ප්‍රකාශ කිරීමෙහි යෙදී සිටින බවයි.

52. මෙකී තත්වාකාරයන් අනුව, පැමිණිලිකරුවෝ ප්‍රකාශ කර සිටින්නේ, P13(a) සහ P13(b), P14 සහ P15(a) සහ (b) වශයෙන් ලකුණු කර ඇති එකී ලේඛනයෙන්හි අඩංගු චෝදනා සහ/හෝ ප්‍රකාශයන් ව්‍යක්තව සහ ව්‍යංගයෙන් යන දෙයාකාරයෙන්ම අසත්‍ය සහ එකී

ස්වභාවයෙන්ම අපහාසාත්මක බවයි. මෙම අපහාසාත්මක අංගයෙහි පහත ස'දහන් කරුණු ඇතුලත් අතර ඒවාට සීමා නොවේ:

අ) පැමිණිලිකරු ඇතුළු, ශ්‍රී ලංකා ක්‍රිකට් හි නිළධාරීන් විසින් ආයතනයේ අරමුදල් අයුතු ලෙස අත්කරගෙන ඇති බවට හැ'ගීමක් මතුකර දක්වන බවත්,

ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම අරමුදල් ඒවායේ චේතනිය භාවිතය වෙනුවට තම පවුලේ සාමාජිකයන් සහ මිතුරන් වෙනුවෙන් වැයකර ඇති බවට හැ'ගීමක් උත්පාදනය කරන බවත්,

ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම ක්‍රිකට් ක්‍රීඩකයන්ට ප්‍රමාණවත් සැලකිල්ලක් ලබා නොදෙන බවට හැ'ගීමක් ප්‍රකාශයට පත්කරන බවත්,

ඈ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වැරදිකරුවන් ලෙස හංවඩු ගසන ලද පුද්ගලයන්ගෙන් සමන්විත බවට ආරෝපණය කරන බවත්ය.

53. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරු විසින් වැරදිසහගතව සහ/හෝ අනිතිකව සහ/හෝ ද්වේෂයෙන් සහ/හෝ වැරදිසහගත චේතනාවෙන් සහ/හෝ හිංසක චේතනාවෙන් ක්‍රියා කර ඇති බවත් සහ එමගින් පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් ඉහත සදහන් අපහාසාත්මක ප්‍රකාශ සහ/හෝ චෝදනාවන් කර ඇති බවයි.

<u>විත්තිකරුට එරෙහිව පළමුවන නඩු නිමිත්තක් සදහා</u>

54. පැමිණිලිකරුවන් ඉහත 1 සිට 53 දක්වා ඡේදයන්හි අඩංගු කරුණු පුනරුච්චාරණය කර සිටිති.

55. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, 2023 ජුලි 23 දිනැති P13(a) සහ (b), වශයෙන් ලකුණු කර ඇති එකී මාධ්‍ය සාකච්ජාව, ශ්‍රී ලංකාව තුල සියළුම ප්‍රධාන පෙළේ රූපවාහිනී නාළිකා සහ සමාජ මාධ්‍ය නාළිකාවල පුළුල් ආවරණයක් ලබාගත් බවත්, එහිදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට එරෙහිව නගන ලද අපහාසාත්මක සහ ප්‍රකාශන සහ/හෝ චෝදනාවන් ප්‍රචලිත මාධ්‍ය නාළිකා හරහා පුළුල් ප්‍රේක්ෂක පිරසක් වෙත මුදාහරින ලද බවත්ය.

56. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශයන්හි අඩංගු වචන සහ/හෝ ප්‍රකාශ සහ/හෝ චෝදානවන්හි ව්‍යක්ත, ස්වභාවික, සාමාන්‍ය සහ ව්‍යංග අර්ථයන් සහ/හෝ ගුණාර්ථයන් සහ/හෝ ගම්‍යාර්ථයන් හුදෙක් අසත්‍ය පමණක් නොව, පැමිණිලිකරුවන් කෙරෙහි අපහාසාත්මක වන අතර, විත්තිකරු විසින් මහජනයා සහ ක්‍රිකට් ලෝලීන් අතර පැමිණිලිකරුවන් වෛරයට, උපහාසයට සහ අවඥාවට ලක් කර ඇති බවයි.

57. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරු විසින් කරන ඇති චෝදනාවන් සහ/හෝ ප්‍රකාශයන් ඒ ස්වරූපයෙන්ම සහ/හෝ වක්‍රෝක්තියෙන් පැමිණිලිකරුවන් කෙරෙහි අපහාසාත්මක බවයි.

58. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ ඉහත සදහන් තත්වාකාරයන් මත, පහත සදහන් සහනයන් ලබා ගැනීම සඳහා පැමිණිලිකරුවන්ට නඩු නිමිත්තක් උපචයවී ඇත:

i. විත්තිකරුගෙන් රුපියල් 500,000,000/- ක මුදලක් මෙදින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා නෛතික පොලිය සමගින් සහ අනතුරුව තීන්දු ප්‍රකාශිත මුළු මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියද සමගින් අයකර ගැනීමට සහ නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක්,

ii. P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන මොනයම් හෝ අපහාසාත්මක ප්‍රකාශයක් ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට විරුද්ධව කිරීමට විත්තිකරුට හිමිකම් නොමැති බවට ප්‍රකාශයක්,

iii. P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන ස්ථිර ඉන්ජන්ෂන් තහනම් නියෝගයක්,

iv. මෙම නඩුව අසා නිමවන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක්, සහ

v. අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් සඳහාවූ ඉල්ලීම අසා තීරණය කරන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව

පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන වාරණ නියෝගයක්.

<u>විත්තිකරුට එරෙහිව දෙවන නඩු නිමිත්තක් සඳහා</u>

59. පැමිණිලිකරුවන් ඉහත 1 සිට 53 දක්වා ඡේදයන්හි අඩංගු කරුණු පුනරුච්චාරණය කර සිටිති.

60. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, 2023 ජූලි 24 දිනැති P14 වශයෙන් ලකුණු කර ඇති එකී පුවත්පත් ලිපිය, ශ්‍රී ලංකාව තුල සියළුම ප්‍රධාන පෙළේ රූපවාහිනි නාළිකා සහ සමාජ මාධ්‍ය නාළිකාවල පුළුල් ආවරණයක් ලබාගත් බවත්, එහිදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට එරෙහිව නගන ලද අපහාසාත්මක සහ ප්‍රකාශන සහ/හෝ චෝදනාවන් ප්‍රචලිත මාධ්‍ය නාළිකා හරහා පුළුල් ප්‍රේක්ෂක පිරසක් වෙත මුදාහරින ලද බවත්ය.

61. එකී පුවත්පත් ලිපියේදී අඩංගු විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශයන්හි අඩංගු වචන සහ/හෝ ප්‍රකාශ සහ/හෝ චෝදනාවන්හි ව්‍යක්ත, ස්වභාවික, සාමාන්‍ය සහ ව්‍යංග අර්ථයන් සහ/හෝ ගුණාර්ථයන් සහ/හෝ ගම්‍යාර්ථයන් හුදෙක් අසත්‍ය පමණක් නොව, පැමිණිලිකරුවන් කෙරෙහි අපහාසාත්මක වන අතර, වන අතර, විත්තිකරු විසින් මහජනයා සහ ක්‍රිකට් ලෝලීන් අතර පැමිණිලිකරුවන් වෛරයට, උපහාසයට සහ අවඥාවට ලක් කර ඇති බවයි.

62. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, එකී පුවත්පත් ලිපියෙන් විත්තිකරු විසින් කරන ඇති චෝදනාවන් සහ/හෝ ප්‍රකාශයන් ඒ ස්වරූපයෙන්ම සහ/හෝ වක්‍රෝක්තියෙන් පැමිණිලිකරුවන් කෙරෙහි අපහාසාත්මක බවයි.

63. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ ඉහත සඳහන් තත්වාකාරයන් මත, පහත සඳහන් සහනයන් ලබා ගැනීම සඳහා පැමිණිලිකරුවන්ට නඩු නිමිත්තක් උපචයවී ඇත:

i. විත්තිකරුගෙන් රුපියල් 500,000,000/- ක මුදලක් මෙදින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා නෛතික පොලිය සමගින් සහ අනතුරුව තීන්දු ප්‍රකාශිත මුළු මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියද සමගින් අයකර ගැනීමට සහ නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක්,

ii. P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන මොනයම් හෝ අපහාසාත්මක ප්‍රකාශයක් ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට විරුද්ධව කිරීමට විත්තිකරුට හිමිකම් නොමැති බවට ප්‍රකාශයක්,

iii. P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන ස්ථිර ඉන්ජන්ෂන් තහනම් නියෝගයක්,

iv. මෙම නඩුව අසා නිමවන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක්, සහ

v. අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් සඳහාවූ ඉල්ලීම අසා තීරණය කරන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන වාරණ නියෝගයක්.

<u>විත්තිකරුට එරෙහිව පැන්වන නඩු නිමිත්තක් සඳහා</u>

64. පැමිණිලිකරුවන් ඉහත 1 සිට 53 දක්වා ඡේදයන්හි අඩංගු කරුණු පුනරුච්චාරණය කර සිටිති.

65. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, 2023 ජුලි 25 දිනැති P15 වශයෙන් ලකුණු කර ඇති එකී හඬපටය, ශ්‍රී ලංකාව තුල සියළුම ප්‍රධාන පෙළේ රූපවාහිනී නාලිකා සහ සමාජ

මාධ්‍ය නාලිකාවල පුළුල් ආවරණයක් ලබාගත් බවත්, එහිදී ශ්‍රී ලංකා ක්‍රිකට් එරෙහිව නගන ලද අපහාසාත්මක සහ ප්‍රකාශන සහ/හෝ චෝදනාවන් ප්‍රචලිත මාධ්‍ය නාලිකා හරහා පුළුල් ප්‍රේක්ෂක පිරසක් වෙත මුදාහරින ලද බවත්ය.

66. එකී පුවත්පත් ලිපියේදී අඩංගු විත්තිකරු විසින් කරන ලද ප්‍රකාශයන්හි අඩංගු වචන සහ/හෝ ප්‍රකාශ සහ/හෝ චෝදනාවන්හි ව්‍යක්ත, ස්වභාවික, සාමාන්‍ය සහ ව්‍යංග අර්ථයන් සහ/හෝ ගුණාර්ථයන් සහ/හෝ ගම්‍යාර්ථයන් හුදෙක් අසත්‍ය පමණක් නොව, පැමිණිලිකරුවන් කෙරෙහි අපහාසාත්මක වන අතර, වි විත්තිකරු විසින් මහජනයා සහ ක්‍රිකට් ලෝලීන් අතර පැමිණිලිකරුවන් වෛරයට, උපහාසයට සහ අවඥාවට ලක් කර ඇති බවයි.

67. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, එකී විත්තිකරු විසින් කරන ඇති චෝදනාවන් සහ/හෝ ප්‍රකාශයන් ඒ ස්වරූපයෙන්ම සහ/හෝ වක්‍රෝක්තියෙන් පැමිණිලිකරුවන් කෙරෙහි අපහාසාත්මක බවයි.

68. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ ඉහත සදහන් තත්වාකාරයන් මත, පහත සදහන් සහනයන් ලබා ගැනිම සදහා පැමිණිලිකරුවන්ට නඩු නිමිත්තක් උපචයවී ඇත:

i. විත්තිකරුගෙන් රුපියල් 500,000,000/- ක මුදලක් මෙදින සිට තින්දු ප්‍රකාශ දින දක්වා නෛතික පොලිය සමගින් සහ අනතුරුව තින්දු ප්‍රකාශිත මුළු මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියද සමගින් අයකර ගැනිමට සහ නඩු තින්දුවක් සහ තින්දු ප්‍රකාශයක්,

ii. P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන මොනයම් හෝ අපහාසාත්මක ප්‍රකාශයක් ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට විරුද්ධව කිරීමට විත්තිකරුට හිමිකම් නොමැති බවට ප්‍රකාශයක්,

iii. P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන ස්ථිර ඉන්ජන්ෂන් තහනම් නියෝගයක්,

iv. මෙම නඩුව අසා නිමවන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි

සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක්, සහ

v. අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් සඳහාවූ ඉල්ලීම අසා තීරණය කරන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභීන් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන වාරණ නියෝගයක්.

69. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, එකී අපහාසාත්මක ප්‍රකාශයන්ට නොයෙකුත් රූපවාහිනී නාලිකාවන්, අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය වේදිකා තුලින් පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලද බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් මහජනතාව අතර විස්තීර්ණ හෙළිදරව්වකට ලක්වූ බවත්ය.

70. පැමිණිලිකරුවන් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, **ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් තවමත් තම හේතු සපයා නොමැති කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන** විත්තිකරු විසින් කරන ලද ඉහත සඳහන් අපහාසාත්මක ප්‍රකාශන සහ/හෝ චෝදනාවන්හි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බලවත් හානියක් විඳින්නට සිදුව ඇති බවත් සහ ජනප්‍රවාදය, ගෞරවය, ප්‍රතිරූපය සහ කීර්තිනාමය අහිමි වීමෙන් දිගටම හානි විඳීමට සිදුවන බවත්, පොදු මහජනතාව අතර ශ්‍රී ලංකා ක්‍රිකට් තවදුරටත් අපවාදයට, පිළිකුලට සහ අපහාසයට විවර වනු ඇති බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි දෛනික කටයුතු කෙරෙහි සහ ජාත්‍යන්තර තරගාවලි රැසකට සහභාගි වන ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයන්ට තදබල බලපෑමක් ඇති වන බවත්, සහ එබැවින් අයැද ඇති අතුරු නියෝග නිකුත් නොකලහොත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සහ/හෝ පැමිණිලිකරුවන්ට බලවත් සහ/හෝ පිරිමසාලිය නොහැකි පාඩු සහ/හෝ අලාභ හානි සිදුවන බවයි.

71. පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, අපහාසාත්මක සහ නින්දිත ලිපි ප්‍රසිද්ධ කිරීමේ විත්තිකරුගේ අඛණ්ඩ ක්‍රියාවලිය නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් හි කීර්තියට පිරිමසාලිය නොහැකි පාඩු සහ/හෝ අලාභ හානි සිදුව ඇති බවයි.